# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/24 – 2024 ජනවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/40

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

33 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ වන මා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥා පනතේ කාර්යය සඳහා ''පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්'' ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2023 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ රස්නක වැව භූමි ප්‍රදේශය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 118, රස්නක වැව ග්‍රාම නිලධාරි වසමේ රස්නක වැව යන ගම පිහිටි විහාරකන්ද කැලේ නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අවසාන ගම් පිඹුරු අංක 1732 හි සඳහන් කැබලි අංක 10, 30 සහ 32 දරන ඉඩම් වලින් සමන්විත අනුරේඛන අංක AA/DSO/2020/360 දරන සහ 2020.08.28 දින දරන පිඹුරේ කැබලි අක්ෂර 'A' ලෙස නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් විසිදෙකයි දශම බිංදුවයි හතයි බිංදුවයි හයක් (හෙක්ටයාර් 22.0706) වූ ඉඩම් කොටස වේ:

EOG 01 – 0091

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.